

# ප්‍රභාකරන්ගේ අවසන්භාගය...?

ආර් ප්‍රේමදාස ජනාධිපතිවරයා සමයේ රාජ්‍ය ආරක්‍ෂක ඇමතිවරයා වශයෙන් කටයුතු කලේ රන්ජ-න් විජේරත්න මහතාය. කොටි සමග ගත කල මධුසමය බිඳී ඉහිරී නැවත සටනට එළැඹි පේමදාස මහතා රන්ජන් විජේරත්න මහතාට අණ දුන්නේ කෙසේ හෝ නැවතත් කොටි සංවිධානය අඩපන කරන ලෙසය. එම සටන ඇදීගෙන යනවිට රන්ජන් විජේරත්න මහතා මාධ්‍යයට ප්‍රකාශ කලේ ප්‍රභාකරන් ජීවතුන් අතර නැති බවය. හමුදා බුද්ධි අංශ වාර්තාවලට අනුව ප්‍රභාකරන් මියගොස් ඇති බවත් කොටි සංවිධානයේ චිත්ත ධෛර්යය බිඳී වැටේවි යයි යන බියට ඔවුන් එය රහසක් වශයෙන් තබාගෙන ඇති බවත්ය. නමුත් ටික කලකට පසු ප්‍රභාකරන් කරලියට ආවේය. ඔහු කරලියට එන විට රන්ජන් පෙරේරා මහතා ජීවතුන් අතර නැත.

දෙවන වර ප්‍රභාකරන් මියගියේ සුනාමි විපතෙනි. මුහුද ගොඩ ගලා ප්‍රභාකරන්ගේ බංකර් හා පොළව යට මාලිගා වතුරට බිලි වී ඔහු මියගොස් ඇති බවත් ඒ බව සනාත වන්නේ රාජ්‍ය නොවන සංවිධාන හරහා උතුරට ප්‍රවාහනය කරන ලද ප්‍රභූ මිනි පෙට්ටි නිසා බවත්ය. එදා ආරක්‍ෂක නියෝජ්‍ය ඇමතිව සිටි බස්තමෙන් ගිය සපුමල් කුමරුගේ කාලය අවසන් වී ගෙදර ගියත් ප්‍රභාකරන් සිනාසෙමින් නැවතත්

***<u>නමුත් මේ පවතින යුද්ධයෙන් දෙමළ ජනතාවට කිසිවක් නොලැබෙන බව අවබෝධ කරගත් අනෙක් දෙමළ ගරිල්ලා නායකයන් එය අතහැර ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට පිවි-සියේය. එයින් එක් අයකු වන්නේ ඩග්ලස් දේවානන්දය.</u>***

කරලියට ආවේ මුළු මුහුදම ගොඩ ගැලුවත් මාව මරන්න කාටවත් බැහැ යන සිනාමුසු මුහුණෙනි.

තුන්වෙනි වර ප්‍රභාකරන් කොටි සංවිධානයේ වීරදින පණිවිඩය ප්‍රකාශ කරන විට ආරක්‍ෂක ලේකම් ගෝඨාභය රාජපක්‍ෂ මහතා කීවේ ප්‍රභාකරන්ගේ මේ අවසන් වීර දින පණිවිඩය බවයි. ඊට සති දෙක තුනකට පමණ පසු මාධ්‍යය වාර්තා කලේ ගුවන් හමුදාව හෙලූ බෝම්බ ප්‍රහාරයකින් ප්‍රභාකරන් බරපතල තුවාල ලබා ඇති බවයි. කලින් ප්‍රකාශ දෙකම බොරු වුවත් මෙම ප්‍රකාශය අපට සත්‍යයක් බවට පිලිගත හැක්කේ දෙමළ මාධ්‍යද එය සනාත කරන නිසයි. -මරණ තුනක් ඇති මිනිහෙක් පැණි කෑය" යන වදන බොරු කරමින් දියවැඩියාව නිසා පැණි කන්නට බැරි ප්‍රභාකරන් අද 50% 60ක් මිය ගොස් ඇත. ජීවත් වුනත් ක්‍රියාශීලී නායකයෙක් ලෙස ඔහුට තව දුරටත් කොටි සංවිධානයේ කටයුතු කල නොහැක.

ප්‍රභාකරන් තමන්ගේ ජාතිය නැතිකල මිනිසෙකි. ඔහු එදා තමන්ගේ පියෙක් වැනි සිටි දොරේ අප්පා මැරුවේය. ඊට පසු තමන්ට උදව් කල අනෙක් සංවිධාන වල නායකයන් මැරුවේය. එදා තමුන්ගේ දකුණු අත වගේ සිටි මහත්තයාට දස වධ දී මැරුවේය. තමන්ව මරණයනේ බේරාගෙන වෙඩි නොවදින කබායක් පවා පරිත්‍යාග කල රජීව් ගාන්ධි මැරුවේය. මුළු ලෝකයටම කියා තමුන්ට නමක් හදාදුන් අමිර්තලිංගම් මැරුවේය. තමුන්ව සාම මාවතකට කැන්දන් ඒමට වෙර දැරූ ලක්‍ෂමන් කදිරගාමර් මහතා මැරුවේය. ඊට අමතරව 25000ක පමණ දෙමළ ජනතාවක් ඔහු නිසා මැරුම් කෑවේය. ඊට සමානව දකුණේ සිංහල ජනතාවක් ද ඔහු සමග සටන් කර හෝ බෝම්බවලට බිලි වී හෝ මායිම් ගම්මානවල ජීවත් වී හෝ මිය ගියේය. මේ මට මතක් වූ කීපයක් පමණි. අවුරුදු 25ක් පුරාවට පමණ මෙම යුද්ධයේ තව මතක් කල යුතු දෑ බොහෝය.

නමුත් මේ පවතින යුද්ධයෙන් දෙමළ ජනතාවට කිසිවක් නොලැබෙන බව අවබෝධ කරගත් අනෙක් දෙමළ ගරිල්ලා නායකයන් එය අතහැර ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට පිවිසියේය. එයින් එක් අයකු වන්නේ ඩග්ලස් දේවානන්දය. මුලින් ඔහු බැංකු මංකොල්ලකරුවෙකි. මිනීමරුවෙකි. නමුත් ඒ සියල්ල අතහැර අද ඔහු සාමකාමී මිනිසෙකු වශයෙන් රජයේ ප්‍රධාන ඇමතිවරයෙක් වී සිටී. ඔහු 12 වතාවක් ප්‍රභාකරන්ගේ ග්‍රහනයෙ-න් බේරුනු මිනිසෙකි. එන පොට හොඳ නැති වන ජාම බේරා ගත් අනෙක් පුද්ගලයා වන්නේ විනසානමූර්ති මුරලිකුරන් නොහොත් කරුණාය. ඔහුද දහස් ගණන් මැරූ මිනිමරුවෙකි. නමුත් අද ඔහු සමකාමී නැතත් සටන අතහැර ලන්ඩනයේ නිවාස අඩස්සියේ සිටී. එලෙසට තවත් දහස් ගණන් දෙමළ තරුණ තරුණියන් තමුනගේ ගෙවල් දොරවල් රැකියා අතහැර වෙනත් රටවල්වල ජීවත් වෙති. එම නිසා රටක් ගන්නට වෙර දැරූ ප්‍රභාකරන් තම ජාතියට උන්හිටි තැන් පවා අහිමි කර ඇත.

අද ලෝකය විශ්ව ගම්මානයකි. එදා රජ කාලේ වාගේ නොව වෙනම රටවල් බිහි කිරීම අපහසු කාර්යයකි. දෙමළ ජාතිය වෙනුවෙන් රටක් නිර්මාණය කිරීමට වෙර දැරූ ප්‍රභාකරන් සටන පටන් ගත්තේ වැරදි තැනක සිටය. ඒ පුංචි තිතක් මෙන් පෙනෙන ලංකාවේ ඉහල කොටසේ මුල්ලක සිටය. නමුත් දෙමළ නිජ භූමිය වන තමිල්නාඩුවේ සිට ප්‍රභාකරන් එම දෙමළ ජනතාවගෙන් එදා වෙනම රාජ්‍යයකට සටන් කරන්න කියා නොඉල්ලුවේ මන්ද? අද ලෝකයේ හැම තැනකම ජාතියක්ම ජීවත් වෙති. අද ජාතීන් මිශ්‍ර වී ඇත. සම්මිශ්‍රණ ජාතීන්ගේ වර්ධනය වේගයෙන් ඉහල යයි. නමුත් කැලයේ ජීවත් වෙන ගරිල්ලා නායකයෙකු වූ නේපාලයේ මාබ්වාදී ගරිල්ලා නායකයා ප්‍රභාකරන්ගෙන් ඉල්ලා සිටියේ රජයට බාරවන ලෙසය. නමුත් ඔහු කිසි දිනෙක බාරවන්නේ නැත. බාරවී වැඩක් නැත. අද ඔහු කල යුත්තේ විජේවීර සේ තම ජාතියේම එකෙකුගෙන් වෙඩි කෑමයි. නැත්නම් සයනයිඩ් කරලක් හපාගෙන සියදිවි හානිකර ගැනීමයි. පැටවුන්ට සයනයිඩ් කන්නට ඉගැන්වූ ප්‍රභාකරන් කිසිදාක සයනයිඩ් කා මිය යන්නේ නැත. ඔහුට මිය යාමට ඇත්තේ දුක් විඳය. මිනිසුන් වයසට යන විට මරණ බිය වැඩිවෙයි. එය ගරිල්ලා සටන්කාමී වචනවලට වැලැක්විය නොහැකි දෙයකි. ප්‍රභාකරන් දුක් විඳින්නේ ඒ නිසාය. ඒ නිසා ඔහු උපන්ගෙයි මෝඩයෙකි. ඒ නිසා ඔහු වෙනුවෙන් මට මේ ලිපියෙ-න් මතක් වෙන්නේ ජාතක කතා සංග්‍රහයේ එන නංගුලීස ජාතකයයි. ප්‍රභාකරන් තම ජනයාද දුටුවේ නගුලක මිට ලෙසය. විරුද්ධ ජනයාද යුද්ධයද දුටුවේ නගුලක මිටක් ලෙසය. නගුලිසක් හැර ඔහු තම ජාතිය වෙනුවෙන් වෙන විකල්පයක් තෝරා ගත්තේ නැත. ඒ නිසා උපන්ගෙයි මෝඩයා ප්‍රඥාවන්තයෙක් කිරීමට කාටවත් බැරිය.




NEW FUTURES TRAINING
VICSEG

PCA- CERTIFICATE III IN AGED CARE CHC30102 or
PSA - CERTIFICATE III IN PATIENT SERVICES HLT30802
One day per week for 22 weeks plus
a work placement
Great employment opportunities

Study grants available for eligible applicants
Contact: New Futures Training
11 Munro Street, Coburg 3058
Tel: 93832533 (BH)
nft@vicseg.com.au

ඔබේ ශ්‍රී ලාංකික දන්ත වෛද්‍යවරයා
Dr Shahnaaz Ozeer
B.D.S. , Dip. Clin. Dent (Restorative) NZ
Dip. Clin. Dent (Oral Medicine) NZ
DENTIST
Facilities are also available for :
Mini implants
Whitening of teeth
Aesthetic dentistry
Preventive Care
Sannasa
1254 Plenty Road, Bundoora 3083
Tel : 03 9467 7760

රුවින් දිළෙන්නට



ඔබේ සොඳුරු මංගල දිනයේ
අපේ සම්ප්‍රදායික රටාවෙන් හා
නවීන විලාසිතාවෙන්
පිරිපුන් මනාලියක දක්වා හැඩ වීමට

මනාලියන්ගේ මල් කළඹ සැකසීම

ඔබේ සියලුම රූපලාවන්‍ය කටයුතු
එකම තැනකදී පහසු මිලකට

- කාන්තා කොණ්ඩා කැපීම හා කොණ්ඩා මෝස්තර
- පර්ම් කිරීම ස්ට්‍රේට් කිරීම කලර් කිරීම
- ටින්ට් කිරීම රිබොන්ඩිං කිරීම
- ෆේෂල් කිරීම වැක්ස් කිරීම
- ත්‍රෙඩින් කිරීම මුහුණ බ්ලීච් කිරීම යම බ්ලීච් කිරීම ඇතුලු සියලුම රූපලාවන්‍ය කටයුතු සඳහා

දස වසරක පළපුරුද්ද සමගින්
උසස් ඩිප්ලෝමාධාරිණී

ප්‍රෂානි සුරවීර
Salon Colour Box
14 Winterton Close
Epping
TP 9401 3727 / 0425 805 754